**විල්ගමුව ප්‍රාදේශීය සභාව.**

**----------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 17 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති තොගය අගය කළ පදනම දක්වා නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.85,061 ක් පුස්තකාල පොත් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) "e" නැණ පියස පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් වෙනම ඒකකයක් ලෙස හදුනාගෙන අවසන් ගිණුම් වලට ගැලපිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ආදායම වූ රු.124,873ක් ආදායම් ශීර්ෂය 6/43 යටතේ ද වියදම වූ රු.365,858 විවිධ වියදම් යටතේ ද ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා තොග ලෙස රු.65,434 ක් ගිණුමේ දක්වා ඇතත් භෞතිකව එවැනි තොගයක් දක්නට නොලැබිණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.34,984,372 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.2,097,403 ක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

--------------------

ඉකුත් වර්ෂය අවසානයට රු.6,106,338 ක්වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයට සමාලෝචිත වර්ෂයේදී රු.7,840,362 ක් හර හා රු.7,080,008 ක් බැර කිරීම හේතුවෙන් වර්ෂය අවසානයට ශේෂය රු.760,895 ක් වූ අතර වර්ෂ කිහිපයක සිට අවිනිශ්චිත ගිණුම නොකඩවා ගිණුම් වල පෙන්නුම් කරන අතර එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.902,054 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක වටිනාකම සහ ගෙවිය යුතු රු.3,612 ක් වූ ගිණුම් ශේෂය අගය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු නොකර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනඑමින් තිබුණි.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------------

එකතුව රු.11,471,026 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 217 | සභාව සතු සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එල් 46 අකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මිල ගණන් කැඳවීම තුලින් තරඟකාරී ලෙස රක්ෂණ පහසුකම් ලබා නොගෙන රක්ෂණ නියෝජිතයෙකු මඟින් සභාව සතු වාහන 11 ක් රක්ෂණය කිරීම නිසා සභා අරමුදලට රු.26,037 ක පාඩුවක් වී තිබුණි. |
| (ඇ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1523/16 දරන 2008 ක් වූ ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ "ඇ" කොටස | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපෘති ක්‍රියාවලි සහිත වී මෝල්, ධාන්‍ය ඇඹරුම්හල් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දී නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | වසර 8 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.2,957,360 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,553,766 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,576,228ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,022,462 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 වරිපනම්
----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි 15 ක් සම්බන්ධව තාවකාලිකව තක්සේරු කර වරිපනම් අයකර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායම අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු වරිපනම් ගාස්තු ලෙස රු.101,484 ක් අයවීමට තිබුණි.

2.2.2 බදුකුලී
--------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මාසික කඩ කුලී රු.236,253 ක්, හිඟ කඩකුලී රු.660,816 ක් හා මුහුදු මාළු කඩ කුලි රු.3,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්
------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ හදුනාගත් ත්‍රීවීල් රථ නැවතුම්පල වලින් ගාස්තු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ ජල ගාස්තු ලෙස රු.818,150 ක් අයවීමට තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හිඟ උසාවි දඩ රු.3,888,925 ක් හා මුද්දර ගාස්තු රු.82,000 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 වර්ෂයේ සිට සභාවේ සේවය කොට විශ්‍රාම ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 7 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.83,421 ක් වූ සේවක ණය සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර නොතිබුණි.

(ආ) මාර්ග තලනය සේවයේ යෙදවීමේදී විධිමත් අධීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, ධාවන සටහන් තබා ගැනීම හා ඒවා නිතිපතා පරිපාලන නිලධාරී ලවා පරීක්ෂා කරවා ගෙන නොතිබුණි. මාර්ග තලනය සඳහා පුද්ගලයන් / ආයතන ලබාදෙන ඉන්ධන ධාවන සටහන් වලට ඇතුළත් කිරීම ද කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ සභාවට එවා තිබුණු ගැල්වනයිස් බට 273 න් 17 ක් අස්ථාන ගත වී තිබුණි.

(ඈ) විල්ගමුව ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයක් 2013 මාර්තු 22 දින අනතුරකට ලක්වීම සම්බන්ධව සිදුකරන ලද මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාව 2014 අප්‍රේල් 04 දින නිකුත් කර තිබුණ ද, අලාභයට වගකිව යුතු ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයාගෙන් අයවිය යුතු රු.16,705 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්ය මණ්ඩල පුරප්පාඩු 14 ක් පැවතීම නිසා සභාවේ කාර්ය සාධනය කෙරෙහි එය සෘජුව බලපා තිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාව සතු වාහන 5 ක් වසර 10 ක කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

හෙට්ටිපොල ළමා උද්‍යානය සංවර්ධනය කිරීම

පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් නඟාසිටුවීමේ වැඩසටහන යටතේ ලැබී තිබුණු රු.1,200,000 ක ප්‍රතිපාදන මත හෙට්ටිපොල ළමා උද්‍යානය සංවර්ධනය කර තිබුණ ද, භූමිය සමතලා කර නොතිබීම හා වල් බිහිවී තිබීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

2016 අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සැලසූ රු.500,000 ක සහා කර්මාන්ත 2 ක් අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුව වන මෙට්‍රික් ටොන් 01 කට ආසන්න කසල වර්ග කිරීමකින් තොරව එකතු කර රජයේ ඉඩමකට බැහැර කරන බැවින් එම කසල සතුන් ආහාරයට ගැනීම නිසා සතුන් මිය යාමට ඉඩ තිබීම මෙන්ම අවට පරිසරය අපිරිසිදු වී ඇති බව නිරීක්ෂණය විය.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර ඇතත් කිසිදු විගණන විමසුමක් විගණකාධිපති වෙත එවා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------------

2014 අගෝස්තු 8 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන තිබුණ ද ,එක් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5 පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) වත්කම් පාලනය
(ආ) ආදායම් රැස්කිරීම
(ඇ) ගබඩා පාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය